**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරික්ෂණය** | **2018** | **11 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 11** |
| **First Term Test** | **2018** | **Grade 11** |

| | |
|---|---|
| ***දේශීය නර්තනය – I*** | ***පැය එකයි*** |
| ***Dancing - I*** | ***One hours*** |

නම/විභාග අංකය :- ..........................................................................................

➢ **ප්‍රශ්න අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු වචන තෝරන්න.**

(1) ලය ප්‍රභේද අනුව නර්තනයේ දී ඉතා අඩු වේගය ........................................ ලෙස හැඳින් වේ.

i. විලම්භ  ii. අතිද්‍රැත  iii. මධ්‍ය  iv. ද්‍රැත

(2) 'රන්විලි දෙකොනට සොඳින් තබන්නේ ' මෙම කවි පදය අයත් වන්නේ ........................ නැටුමටය.

i. ගොයම්.  ii. ලී කෙලි  iii. කුළු  iv. මෝලගස්

(3) ලී දැතට ගෙන කණුවක් වටේ රටා මවමින් නටන ද්‍රවිඩ ගැමි නැටුම ........................ වේ.

i. කෝලාට්ටම්  ii. කාවඩි  iii. සෙම්බු  iv. පින්තල් කෝලාට්ටම්

(4) සබරගමු නැටුම් සඳහා ........................................ විශේෂ තැනක් හිමිවේ.

i. මහනුවර පෙරහැරේ දී  ii. කතරගම පෙරහැරේ දී

iii. සමන් දේවාල පෙරහැරේ දී  iv. වෙල් පෙරහැරේ දී

(5) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ මූලික අංගහාරය ........................................ යි.

i. මණ්ඩිය  ii. දණ්ඩිය  iii. සරඹ  iv. පදය.

(6) අතීතයේ රජුගේ පණිවිඩ ජනතාවට සන්නිවේදනය කිරීමට යොදාගත් විතාතත වාද්‍ය භාණ්ඩයකි ........................

i. රබාන  ii. හොරණෑව  iii. දවුල  iv. උඩරට බෙරය

(7) අදහස් ප්‍රකාශ කිරීමේ දී ආංගික, වාචික, සාත්වික, ආහාර්ය යනුවෙන් හැඳින්වෙන්නේ ........................ යි.

i. අභිනය  ii. තාලය.  iii. ලය.  iv. ගායනය.

(8) ගායනයත් සමග එකවර තාල තැබීම ආරම්භ කිරීම ........................................

i. අවග්‍රහ වේ.  ii. සමග්‍රහ වේ.  iii. විෂමග්‍රහ වේ.  iv. නවග්‍රහ වේ.

(9) සකපෝරුව භාවිතා කරන්නේ ........................................

i. කෘෂිකර්මාන්තය සඳහාය.  ii. තේ කර්මාන්තය සඳහාය.

iii. පතල් කර්මාන්තය සඳහාය.  iv. මැටි කර්මාන්තය සඳහාය

(10) උඩරට නැටුම් කලාව කෘතිය ලියා පලකොට ඇත්තේ ........................ මහතා විසිනි.

i. ජේ.ඊ. සේදරමන්  ii. මුදියන්සේ දිසානායක.

iii. ඩබ්ලිව්.බී මකුලොලුව.  iv. කේ.එස් .ප්‍රනාන්දු

(11) වන්නම් නර්තනය සඳහා වඩාත්ම වැදගත් වන චලන වන්නේ,

i. රිද්මයානුකූල චලනය.  ii. තාලානුකූල චලනය.  iii. අභිචලනය.  iv. ප්‍රකාශනාත්මක චලනය.

(12) පිරිසක් එකතුව වාදනය කරන අවනද්ධ භාණ්ඩයකි.

i. තාලම්පට. ii. උඩැක්කිය. iii. බංකුරබාන. iv. ගැටබෙරය.

(13) පිළිවෙලින් A හා B රූප වලින් දැක්වෙන්නේ


A


B

i. පහතරට තෙල්මේ ඇඳුම හා සබරගමු පබුළු ඇඳුම.

ii. සබරගමු පබළු ඇඳුම හා පහතරට තෙල්මේ ඇඳුම

iii. සබරගමු තෙල්මේ ඇඳුම හා පහතරට තෙල්මේ ඇඳුම

iv. පහතරට තෙල්මේ ඇඳුම හා සබරගමු තෙල්මේ ඇඳුම

(14) නර්තනයක් නිර්මාණයේ දී අවකාශ භාවිතය පිළිබඳ වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ

i. පසුතල නිර්මාණ සඳහා ii. නර්තන ශිල්පීන් සඳහා

iii. ගායන ශිල්පීන් සඳහා iv. ආලෝකකරණය සඳහා

(15) මහනුවර දළදා පෙරහැරේ දැකිය හැකි උඩරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග මොනවාද.

i. උඩැක්කි, පන්තේරු, වෙස් ii. උඩැක්කි, වේවැල්, වෙස්

iii. පන්තේරු, වෙස්, තාලම් iv. උඩැක්කි, වෙස්, තෙල්මේ.

(16) පහතරට බෙරයේ බෙර ඇස සඳහා යොදා ගන්නා ලද්දේ

i. හරක් හමයි. ii. සිවිය (හරක්බොක්ක) iii. එළු හම iv. වඳුරු හමයි

(17) නාට්‍යමය පෙළපාලි බහුලව දක්නට ලැබෙන ශාන්තිකර්ම දක්නට ඇත්තේ

i. උඩරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම තුළය.

ii. පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම තුළය.

iii. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම තුළය.

iv. කලවාන ප්‍රදේශයට අයත් සබරගමු සම්ප්‍රදාය තුලය.

(18) හණ නූලෙන් සකසා පවන් සැලීමට අතීතයේ රාජසභා වලදී යොදාගත් රාජ සභා මෙවලමකි.

i. අවාන ii. සේසත iii. චාමර iv. සේලය

(19) කාන්තා පක්ෂයට වඩාත් උචිත ජන නැටුමකි.

i. ලී කෙලි නර්තනය. ii. කඩු නර්තනය. iii. කළ නර්තනය. iv. පන්තේරු නර්තනය.

(20) උඩරට නර්තන සම්ප්‍රදායේ හා පහතරට නර්තන සම්ප්‍රදායේ සශ්‍රීකත්වය හා ශාන්තිය අපේක්ෂා කරමින් පැවැත්වෙන ශාන්තිකර්ම ලෙස

i. කොහොඹා කංකාරිය හා සන්නියකුම හැඳින්විය හැකිය.

ii. කොහොඹා කංකාරිය හා දෙවොල්මඩුව හැඳින්විය හැකිය.

iii. දෙවොල් මඩුව හා පහන් මඩුව හැඳින්විය හැකිය.

iv. කොහොඹා කංකාරිය හා කිරිමඩුව හැඳින්විය හැකිය.

(21)



මෙම රූපයෙන් පිළිබිඹු වන්නේ

i. ශාන්ත රසයයි.

ii. වීර රසයයි.

iii. රෞද්‍ර රසයයි.

iv. භයානක රසයයි.

(22) කවිකාර මඩුවෙහි රජුගේ නෘත්‍ය මණ්ඩපය ට වන්නම් රචනා කළ බව කියවෙන්නේ,

i. රම්මොලමක අධිකාරම් ය.  ii. ඇහැලේපොල අධිකාරම් ය.

iii. එක්නැලිගොඩ අධිකාරම් ය.  iv. මොල්ලිගොඩ අධිකාරම් ය.

(23) පිළිවෙලින් කෝලම් හා සොකරි නාටකයේ එන චරිත වන්නේ,

i. ජසයා හා ලෙන්චිනාය.  ii. පුරංසිනා හා ලෙන්චිනාය.

iii. සොකරි හා ලෙන්චිනාය.  iv. ජසයා හා ගුරු හාමිය.

(24) කෝලම් රඟමඩල හඳුන්වන්නේ,

i. යක්ගෙය නමිනි.  ii තානායම්පොළ නමිනි.

iii. වීදිය නමිනි.  iv. අංගම්මඩුව නමිනි.

(25) කොහොඹා කංකාරියට සහභාගිවන ප්‍රධාන ඇදුරන් හඳුන්වන්නේ,

i. ආතුරයන් නමිනි.  ii. අතෝරකරුවන් නමිනි.

iii. යකැදුරන් නමිනි.  iv. කොට්ටෝරුවන් නමිනි.

(26) ශාන්තිකර්ම ආශ්‍රිත කවි ගායනා වලින් මෑත කාලයේ දී නිර්මාණය වූ ගැමි නැටුමකි.

i. කොහොඹ කළය  ii. මෝල්ගස් නැටුම.  iii. කඩු නැටුම.  iv. ලී කෙළි නැටුම.

(27) දෙසළු මහා තුන්තිත හඳුන්වනු ලබන්නේ,

i. 2 + 4 + 4  ii. 2 + 4 + 2  iii. 2 + 2 + 4  iv. 4 + 2 + 2

(28) කථකලි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙකකි.

i. තබ්ලාව පච්චාජ්  ii. තබ්ලාව මද්දලය  iii. චෙන්ඩාව මද්දලය  iv. මෘදංගය කෝල්

(29) ආහාර්ය අභිනයෙන් ඉතා පොහොසත් භාරතීය නර්තන සම්ප්‍රදායක් ලෙස හැඳින්වෙන්නේ ,

i. කථකලි නර්තන සම්ප්‍රදාය.  ii. මනිපුරි නර්තන සම්ප්‍රදාය.

iii. කතක් නර්තන සම්ප්‍රදාය  iv. භරත නර්තන සම්ප්‍රදාය.

(30) සෙම්බු ද්‍රවිඩ ජන නැටුමට සමාන දේශීය ජන නැටුම වන්නේ,

i. ලී කෙලි නැටුම  ii. කළගෙඩි නැටුම  iii. කුළු නැටුම.  iv. තාලම් නැටුම.

## උඩරට නර්තනය

(31) දහවන ගොඩසරඹයේ සරඹ නාමය වන්නේ

i. පැනීමේ සරඹය  ii. බඹර සරඹය.  iii. චන්ද්‍රිකා සරඹය.  iv. ඇල සරඹය.

(32) කොහොඹාකංකාරී ශාන්තිකර්මයේ පුරාවෘත කතාව හා සම්බන්ධව එන චරිත දෙකකි.

i. මහසම්මත හා කුවේනි  ii. මහසම්මත රජු හා මැණික්පාල

iii. මලය රජු හා කුවේනි.  iv. මලය රජු හා සේරමන්

(33) උඩරට වෙස් ඇඳුම් කට්ටලය ට අයත් ආභරණ කීපයක් වන්නේ

i. සිඛාබන්ධනය, පායිම්පත, අවුල්හැරය.  ii. උල්උඩය, හගල හා හැඩකැල්ල

iii. පායිම්පත, ගෙජ්ජි සහ හැඩකැල්ල  iv. දෙවල්ල පායිම්පත සහ අවුල්හැරය.

(34) තත් --------- තකරොං ---------- තක්කඩ කුඳ තක රොං යන්නෙහි හිස්තැන්වලට ගැලපෙන පද කොටස තෝරන්න.

i. තකට ජිං  ii. තකට - තක්කඩ  iii. තකට - දොංකඩ  iv. තකට - ජිකට

(35) කොහොඹාකංකාරී ශාන්තිකර්මයේ පුද ලබන ප්‍රධාන දෙවිවරු දෙදෙනෙක් වන්නේ

i. දෙවොල් දෙවි හා වීරමුණ්ඩ දෙවි
ii. වීරමුණ්ඩ දෙවි හා කන්දෙ බණ්ඩාර දෙවි.
iii. දඩිමුණ්ඩ දෙවි හා සමන් දෙවි.
iv. කන්දෙ බණ්ඩාර දෙවි හා දෙවොල් දෙවි.

(36) ගැටබෙරයේ සම්මත දිග ප්‍රමාණය වන්නේ

i. වියත් තුනකි.
ii. තුන්වියත් තුන්ගුලකි.
iii. වයතකි
iv. විග්ගුස්සකි.

(37) උඩරට නර්තන සම්ප්‍රදායේ ගායනය සහිත හ ගායනය රහිත නර්තන අංග ලෙස නම්කෙරෙනුයේ

i. අස්නේ හා යක්කැනුම
ii. යක්කැනුම හා ආවැන්දුමයි.
iii. ආවැන්දුම හා බුලත් පදය.
iv. අස්නය හා කොහොඹා හැල්ලයි

(38) කොහොඹාකංකාරී ශාන්තිකර්මයේ දී වාදකයින්ගේ දක්‍ෂතා පෙන්වීම සඳහා කරනු ලබන්නේ

i. බෙර සරඹ වාදනයයි.
ii. මගුල් බෙර වාදනයයි.
iii. අත්‍යාබෙර වාදනයයි.
iv. අංගුලියා පදය වාදනයයි.

(39) වෙස් ඇඳුම් කට්ටලයේ ආධුනික ශිල්පියෙකු විසින් සුභ මොහොතින් පලඳිණු ලබන ආභරණය වන්නේ

i. පායිම්පත
ii. වෙස්තට්ටුව
iii. ජටාව
iv. කෛයිමෙත්ත

(40) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් නොවන වට්ටමකි.

i. දොං ජිංත ගත දොංත වට්ටම.
ii. කුදාංතගතදොං වට්ටම
iii. ගොග් ගොග් ජිං ජිංගත වට්ටම
iv. ගුද ගතිගත වට්ටම

## පහතරට නර්තනය.

(31) පහතරට සින්දු වන්නමකට අයත් කොටස් ගණන

i. තුනකි.
ii. හතරකි.
iii. පහකි.
iv. හයකි.

(32) දෙවොල්මඩු ශාන්තිකර්මයේ පුරාවෘත කතාව හා සම්බන්ධ චරිත දෙකකි.

i. මලය රජු හා ඌරා
ii. සේරමන් රජු හා දූරා
iii. සේරමන් රජු හා මැඩියා
iv. මලය රජු හා ගෝනා

(33) නාතිලිංචි තාලය සින්දු වන්නම නර්තනය කරනුයේ

i. මාත්‍රා 2 + 4 දෙතිතටය
ii. මාත්‍රා 2 + 3 දෙතිතටය
iii. මාත්‍රා 3 + 4 දෙතිතටය
iv. මාත්‍රා 4 + 4 තනි තිතටය

(34) දෙවොල්මඩු ශාන්තිකර්මයේ පූජා රටාවේ එන පූජා විධි කීපයකි.

i. තොටපේ කිරීම, දේවාභරණ වැඩම කිරීම, මුරුතැන් පිසීම
ii. මිල්ල කැපීම, බිසෝකප සිටුවීම, කාල පන්දම් පූජාව
iii. දළුමුර පිදීම, ආඩිගුරු නැටීම, දේව යාතිකාව
iv. මී කැපීම, මුරුතැන් පිසීම, මිල්ල කැපීම

(35) දොම් -------- ගත ගුගුදිත ගත ---------- දොම් ගත ගත දොම් තා. මෙහි හිස්තැන්වලට ගැලපෙන පද වන්නේ පිළිවෙලින් ,

i. ගුහිතිගදිරිකිට/ තත් දිම්
ii. තත් දිම් / ගුහිතිගදිරිකිට
iii. තත් දිම් / තත් දිම්
iv. ගුහිතිගදිරිකිට / ගුහිතිගදිරිකිට

(36) පහතරට බෙරයේ සම්මත දිග ප්‍රමාණය වන්නේ,

i. වියත් තුනකි.
ii. තුන්වියත් තුනගුලකි.
iii. වියතකි.
iv. විග්ගුස්සකි

(37) පහතරට සින්දු වන්නම් වල,

i. භක්ති කාව්‍ය ලක්ෂණ ඉස්මතුකොට දක්වේ
ii. විනෝදාස්වාදය ඉස්මතුකොට දක්වේ.
iii. හාස්‍ය රසය ඉස්මතුකොට දක්වේ
iv. සරල බව ඉස්මතුකොට දක්වේ

(38) පහතරට බෙරයේ බෙර කද සහ බෙර ලණු සම්බන්ධ කරන්නේ,

i. වෙනිවර කැරැල්ලෙනි.
ii. වරපටයෙනි.
iii. කන්වරයෙනි
iv. කැපුම් හමෙනි.

(39) මාත්‍රා 3 තනි තිතට නැටිය හැකි ඉරට්ටියකි.

i. තක දිත් තක දොම්
ii. ගදිකිට ගතදොං ගුගුද තරි
iii. දිත් තම් දොම් ත ගත් ගත
iv. තත් තිමිතක දිත් දිත් තෙයි

(40) දෙවොල් මඩු ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථා දෙකකි.

i. ශුද්ධ මාත්‍රය, මුගුරු පදය
ii. දෙවොල් , ශුද්ධ මාත්‍රය
iii. තෙල්මේ, ශුද්ධ මාත්‍රය
iv. දෙවොල්ගොඩ බැසීම, අඹවිදමන